# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2473/26 - 2026 ජනවාරි මස 30 වැනි සිකුරාදා - 2026.01.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**එල්.ඩී.-බී 9/73 (XI)**

**(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත**

(469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 56 වන සහ 71 වන වගන්ති සමඟ කියවිය යුතු එකී ආඥාපනතේ 2 වන වගන්තිය යටතේ පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**හෙට්ටිතන්ත්‍රි පටබැඳිගේ දම්මික,**
පරිසර අමාත්‍ය.

2026 ජනවාරි මස 30 දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2026 වන අලි කළමනාකරණ රක්ෂිත (රජයේ ඉඩම් සහ රජයේ ඉඩම් නොවන වෙනත් යම් ඉඩම් කළමනාකරණය කිරීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මෙම නියෝගවල විධිවිධාන -

(අ) යම් වන අලි කළමනාකරණ රක්ෂිතයක් ඇතුළත ස්වකීය ස්වාභාවික වාසභූමි පිහිටා ඇති වන අලින්ගේ නිදහස් පැවැත්ම;

*සහ*

(ආ) ජල මූලාශ්‍ර ඇතුළුව එකී රක්ෂිත තුළ ඒ වන අලින්ගේ ස්වාභාවික වාසභූමි, සංචරණ මාර්ග සහ ආහාර සොයා ගන්නා ප්‍රදේශ සංරක්ෂණය කිරීම,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

තහවුරු කිරීම පිණිස (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරනු ලැබ ඇති යම් වන අලි කළමනාකරණ රක්ෂිතයක් ඇතුළත පිහිටා ඇති රජයේ ඉඩම් සහ රජයේ ඉඩම් නොවන වෙනත් යම් ඉඩම් සම්බන්ධයෙන් සහ ඒවා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

3\. (1) 2 වන නියෝගයේ සඳහන් කරන ලද යම් රජයේ ඉඩමක හෝ රජයේ ඉඩම් නොවන වෙනත් යම් ඉඩමක පහත දැක්වෙන යම් සංවර්ධන කටයුත්තක් කරගෙන යාමට අදහස් කරන එවැනි යම් රජයේ ඉඩමක ප්‍රදානලාභියෙකු හෝ බලපත්‍රලාභියකු හෝ එවැනි රජයේ නොවන වෙනත් යම් ඉඩමක යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් පහත දැක්වෙන ආකාරයෙන් අවස්ථාවෝචිත පරිදි, පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් (EIA) හෝ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් (IEE) සමඟ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(අ) (i) යම් කැණීම් කටයුත්තක්;
(ii) යම් පිපිරවීම් කටයුත්තක්;
(iii) යම් ඇල මාර්ගයක් ඉදිකිරීමක්;
(iv) යම් මාර්ගයක් ඉදිකිරීමක්;
(v) නිවාස ඒකක දහයකට වැඩි සංඛ්‍යාවකින් සමන්විත වන යම් නිවාස සංකීර්ණයක් ඉදිකිරීමක්;
(vi) ප්‍රමාණයෙන් හෙක්ටයාර බිංදුවයි දශම පහකට (0.5) සමාන වන හෝ ඊට වඩා වැඩි වන්නා වූ ප්‍රදේශයක කවර හෝ යම් ආකාරයකින් ඉඩමක පවතින භාවිත රටාව තාවකාලිකව වෙනස් කරන යම් කටයුත්තක්; හෝ
(vii) ප්‍රමාණයෙන් හෙක්ටයාර එකකට (1) වඩා අඩු වන්නා වූ ප්‍රදේශයක යම් ආකාරයෙන් ඉඩමක පවතින භාවිත රටාව ස්ථිර වශයෙන් වෙනස් කරනු ලබන යම් කටයුත්තක්,

සම්බන්ධයෙන් අදාළ ඉල්ලීම පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාවක් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(ආ) (i) (අ) ඡේදයේ සඳහන් කළ යම් කටයුත්තක් නොවන; හෝ

(ii) ඒ ඉඩමේ පවතින භාවිත රටාව ප්‍රසාරණය කිරීම හා සම්බන්ධ වන,

යම් සංවර්ධන කටයුත්තක් සම්බන්ධයෙන්, අදාළ ඉල්ලීම මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාවක් සමඟ ඉදිරිපත් කළ යුතු ය.

(2) වන අලි කළමනාකරණ රක්ෂිතයක් තුළ ප්‍රමාණයෙන් හෙක්ටයාර එකකට (1) සමාන හෝ ඊට වැඩි වන්නා වූ ප්‍රදේශයක කවර හෝ යම් ආකාරයෙන් ඉඩම පවතින භාවිත රටාවෙන් ස්ථිරවම වෙනස් කරන්නා වූ යම් සංවර්ධන කටයුත්තක් සඳහා අනුමැතිය ලබා නොදිය යුතු ය.

(3) මේ නියෝගයේ කාර්යය සඳහා රජයේ ඉඩමක ප්‍රදානලාභියකු හෝ බලපත්‍රලාභියකු යන්නෙන් අදාළ වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කරන දිනයට පෙරාතුව යම් ලිඛිත නීතියක් යටතේ රජයේ ඉඩමක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත පරිදි, යම් ප්‍රදානයක් හෝ බලපත්‍රයක් ප්‍රදානය කරනු ලැබ ඇති යම් තැනැත්තකු අදහස් වේ.

4\. (1) 3 වන නියෝගයේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය හෝ (ඇ) ඡේදය යටතේ යම් ඉල්ලීමක් ලැබුණු පසුව, එම ඉල්ලීම ලැබුණ දින සිට සති දෙකක් ඇතුළත අවස්ථාවෝචිත පරිදි, අදාළ පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව හෝ මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව සමඟ ඒ ඉල්ලීම 7 වන නියෝගය යටතේ පිහිටුවන ලද වන අලි කළමනාකරණ මෙහෙයුම් කමිටුව වෙත එහි නිර්දේශය ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉදිරිපත් කළ යුතු අතර එකී කමිටුව විසින් ඒ ඉල්ලීම ලැබුණ දින සිට මසක් ඇතුළත එහි නිර්දේශය ලිඛිතව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන අනුනියෝගය යටතේ එකී කමිටුව විසින් ඉදිරිපත් කළ නිර්දේශ සලකා බැලීමෙන් පසුව, 3 වන නියෝගය යටතේ ඉල්ලා සිටි අදාළ කටයුත්ත සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඔහුගේ අනුමැතිය ප්‍රදානය කිරීම හෝ නැතහොත් ඔහුගේ අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීම කළ යුතු ය.

(3) 3 වන නියෝගය යටතේ ඉල්ලා සිටින ලද යම් කටයුත්තක් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඔහුගේ අනුමැතිය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී, ඒ ප්‍රතික්ෂේප කිරීමෙන් සති දෙකක කාල සීමාවක් ඇතුළත ඒ සඳහා හේතු දක්වමින් ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඔහු විසින් ඉල්ලුම්කරු වෙත ලිඛිතව දැනුම් දෙනු ලැබිය යුතු ය.

(4) 3 වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයෙන් අතෘප්තියට පත් යම් ඉල්ලුම්කරුවකු විසින් ඒ තීරණය පිළිබඳව දැනුම් දීමේ දිනයෙන් දින තිහක් ඇතුළත ඒ තීරණයට එරෙහිව අභියාචනයක් අමාත්‍යවරයා වෙත ලිඛිතව ඉදිරිපත් කළ හැකි අතර, ඒ අභියාචනය සම්බන්ධයෙන් ආඥාපනතේ 56 වන වගන්තියේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

5\. (1) යම් වන අලි කළමනාකරණ රක්ෂිතයක් ඇතුළත පිහිටා ඇති රජයේ ඉඩමක යම් ප්‍රදානලාභියෙකු, බලපත්‍රලාභියෙකු, වගාකරුවෙකු හෝ පදිංචිකරුවෙකු විසින් හේන්වගාව සඳහා ඒ ඉඩම භාවිත කරන අවස්ථාවක පහත නිශ්චිතව සඳහන් කර ඇති වගා කිරීමේ ප්‍රමිතීන් පවත්වාගෙන යා යුතු ය:-

(අ) හේනේ ප්‍රමාණය අක්කර තුනකට (3) වැඩි නොවිය යුතු ය;

(ආ) වැසි පෝෂක තත්ත්වයන් යටතේ පමණක් බෝග වගා කළ යුතු අතර වගා ළිං හෝ කිසිඳු අකාරයක භූගත ජලය ඉවතට ලබා ගැනීම සඳහා අවසර ලබා නොදිය යුතු ය;

(ඇ) ඉඩමේ කිසිඳු ස්ථිර බෝගයක් වගා නොකළ යුතු ය;

(ඈ) එක් එක් අස්වැන්න නෙලීමේ කාලසීමාව අවසානයේ සහ අස්වැන්න එකතු කිරීමෙන් අනතුරුව කිසිඳු වගා කටයුත්තක් සඳහා ඒ ඉඩම භාවිත නොකළ යුතු වසර දෙකක අනිවාර්යය පුරන් කාල සීමාවක් පැවතිය යුතු ය;

(ඉ) වගා ඉඩම, කලින් කල බෝග මාරු කිරීමේ පදනම මත වගා කළ යුතු ය;

(ඊ) වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කරන දිනයට පෙරාතුව වගා කිරීමේ කාර්යය සඳහා භාවිත කළ ප්‍රදේශවල පමණක් වගා කටයුතු කරගෙන යනු ලැබිය යුතු ය;

(උ) අස්වැන්න එකතු කිරීම අවසන් වූ පසුව විදුලි වැට ඇතුළු වගා බිම වටා යොදා ඇති වැටවල් වහාම ඉවත් කළ යුතු අතර ඒ බෝග වගාව ආරම්භ කිරීමට පෙරාතුවම පමණක් ඒ වැටවල් නැවත ඉදි කිරීම කළ යුතු ය; සහ

(ඌ) ස්ථිර ඉදිකිරීමක් හෝ ස්ථිර ස්වභාවයේ වෙනත් යම් ඉදිකිරීමක් හේන් මත සිදු කිරීමට අවසර නොදිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කර ඇති ප්‍රදානලාභියා, බලපත්‍රලාභියා, වගාකරු හෝ පදිංචිකරු අදාළ වන පරිදි පහත දැක්වෙන තැනැත්තන්ගෙන් කවර හෝ කෙනෙකු විය යුතු ය.

(අ) අදාළ වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශ කරන දිනයට පෙරාතුව හේන් වගාව සඳහා ඒ ඉඩම භාවිත කිරීමට යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ ප්‍රදානය කළ බලපත්‍රයක් හෝ වෙනත් යම් ලිඛිත අවසරයක් දරන තැනැත්තකු විය යුතු ය; හෝ

(ආ) අදාළ වන අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත් කරන දිනයට පෙරාතුව, එකී රජයේ ඉඩම පවරනු ලැබ ඇති යම් රාජ්‍ය ආයතනයක් විසින් පවත්වාගෙන යන වාර්තාවල එවැනි රජයේ ඉඩමක හේන් වගාකරුවකු ලෙස නම ඇතුළත් තැනැත්තකු විය යුතු ය.

6\. මෙම නියෝගවල 2 වන නියෝගයේ සඳහන් කළ පරිදි රජයේ ඉඩමක් නොවන වෙනත් යම් ඉඩමක යම් අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින්, -

(අ) ප්‍රමාණයෙන් පර්චස් හතළිහකට අඩු ඉඩම් කොටස්වලට අනු බෙදීම් නොකළ යුතු ය;

(ආ) 7 වන නියෝගය යටතේ පිහිටුවන ලද වන අලි කළමනාකරණ රක්ෂිත මෙහෙයුම් කමිටුව විමසීමෙන් අනතුරුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව ඒ සඳහා බලය දී ඇත්නම් මිස කිසිඳු ස්ථිර හෝ ස්ථිර නොවන බෝගයක් වගා නොකළ යුතු ය;

(ඇ) ස්වභාවික වනාන්තරයක් එළිකිරීම හෝ ඉවත් කිරීම සම්බන්ධයෙන් ඒ අයිතිකරු හෝ පදිංචිකරු විසින් ඒ සඳහා වන ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කළ පසුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලිඛිතව බලය දී ඇත්නම් මිස කිසිදු ස්වභාවික වනාන්තරයක් එළිකිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

7. (1) මෙම නියෝගවල විධිවිධාන නිසි ආකාරයෙන් ක්‍රියාත්මක කිරීමට අදාළ වන කාරණා පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකා බලා නිර්දේශ ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) වන අලි කළමනාකරණ මෙහෙයුම් කමිටුව ලෙස හඳුන්වනු ලබන මෙහෙයුම් කමිටුවක් එක් එක් වන අලි කළමනාකරණ රක්ෂිතයක් වෙනුවෙන් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) කමිටුවේ සංයුතිය පහත දැක්වෙන පරිදි විය යුතු ය: -

(අ) අවස්ථාවෝචිත පරිදි, වන අලි කළමණාකරණ රක්ෂිතය පිහිටා ඇති අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා හෝ අදාළ දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරු;

(ආ) ආඥාපනතේ විධිවිධාන යටතේ පත් කළ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයා;

(ඇ) (451 වන අධිකාරය වූ ) කැළෑ ආඥාපනතේ විධි විධාන යටතේ පත් කළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ දිසා වන නිලධරයා;

(ඇ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ නේවාසික ව්‍යාපෘති කළමණාකරු හෝ ඔහුගේ නාමිකයෙකු;

(ඉ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඔහුගේ නාමිකයෙකු; සහ

(ඊ) අදාළ ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු.

(3) වන අලි කළමනාකරණ රක්ෂිතය පිහිටා ඇති අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා කමිටුවේ සභාපතිවරයා විය යුතු ය. යම් වන අලි කළමනාකරණ රක්ෂිතයක් එක් දිස්ත්‍රික්කයකට වැඩි දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් තුළ පිහිටා ඇති සහ අදාළ ප්‍රදේශයේ අධිකාරි බලය දරන දිස්ත්‍රික් ලේකම්වරු එක් අයකුට වඩා වැඩි සංඛ්‍යාවක් සිටින අවස්ථාවක දී විශාලතම ඉඩම් ප්‍රදේශය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්වරයා කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.

(4) කමිටුවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින අවස්ථාවක පැමිණ සිටින සාමාජිකයන් විසින් ඒ රැස්වීම සම්බන්ධයෙන් ඔවුන් අතරින් සභාපතිවරයෙකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(5) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කමිටුවේ ලේකම්වරයා වශයෙන් වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂවරයා පත් කරනු ලැබිය යුතු ය.

(6) කමිටුව අවශ්‍ය වන සෑම අවස්ථාවක ම එහෙත් සෑම මාස තුනකට එක් වරකට නොඅඩු වාර ගණනක් රැස් විය යුතු ය.

(7) කමිටුවේ යම් රැස්වීමක සනපුර්ණය ලේකම්වරයා ඇතුළු ව සාමාජිකයන් තුන් දෙනෙකුගෙන් සමන්විත විය යුතු ය.

(8) කමිටුවේ සාමාජිකයෙකු, ඒ සාමාජිකයා කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් ධුර දරන්නේ යම් ධුරයක් දැරීම ප්‍රකාරව ද එකී ධුරය දරන තාක්කල් ධුරය දැරිය යුතු ය.

(9) කමිටුව විසින් 4 වන නියෝගය යටතේ නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී ඔවුන්ගේ අදහස් සලකා බැලීම අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක -

(අ) සංරක්ෂණ ජීව විද්‍යාව, පරිසර විද්‍යාව හෝ පරිසර නීතිය යන ක්ෂේත්‍රවල අධ්‍යයන හෝ වෘත්තිමය සුදුසුකම් සහ පෘථුල පළපුරුද්දක් දරන විශේෂඥවරු; හෝ

(ආ) වන අලි කළමනාකරණ රක්ෂිත පිහිටා ඇති ප්‍රදේශ තුළ ප්‍රජා පාදක සංවිධානවල අනුයෝජිතයන්,

විමසා කටයුතු කළ හැකි ය.

(10) කමිටුවේ සෑම තීරණයක් ම පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ගනු ලැබිය යුතු ය.

(11) ඡන්දය සමාන වන අවස්ථාවක සභාපති ධුරය දරන තැනැත්තාට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(12) කමිටුවේ සභාපතිවරයා විසින් ලිඛිතව බලය දෙන ලද කමිටුවේ සාමාජිකයෙකු හෝ වෙනත් යම් තැනැත්තෙකු විසින් මෙම නියෝගවල විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඒ ඉඩම පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා ඕනෑ ම සාධාරණ වේලාවක 2 වන නියෝගයේ සඳහන් කරන ලද යම් ඉඩම් කොටසකට ඇතුළු විය හැකි ය.

(13) කමිටුවේ කර්තව්‍යයන් විය යුත්තේ -

(i) හැකිතාක් ප්‍රායෝගික විය හැකි ලෙස, 4 වන වගන්තිය යටතේ කමිටුව වෙත යොමු කළ කාරණා පිළිබඳව;

(ii) වන අලි මිනිස් ගැටුම අවම කිරීම පිළිබඳව;

(iii) ආඥාපනතේ 2 අ වගන්තියේ නියමයන්ට අනුව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පත් කළ කළමනාකරණ සැලසුම් කමිටුව විසින් සලකා බැලීම අවශ්‍ය විය හැකි යම් වන අලි කළමනාකරණ රක්ෂිතයක භූමිය භාවිත කිරීම නියාමනය කිරීම පිළිබඳ; සහ

(iv) වන අලි කළමනාකරණ රක්ෂිතයක් තුළ පවතින පාරිසරික ගැටලුවලට අදාළ වන වෙනත් යම් කාරණා පිළිබඳ ව,

අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ය.

8. මෙම නියෝගවල විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තෙකු ආඥාපනත යටතේ වරදක් සිදු කරනු ලබයි.

9. මෙම නියෝගවල පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වේ නම් මිස -

"සංවර්ධන කටයුත්තක්" යන්නට ආඥාපනතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

"අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන් ආඥාපනතේ 68 වන වගන්තිය යටතේ පත් කළ අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ.

" පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව" යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කළ යුතු පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ වාර්තාව අදහස් වේ.

"මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව" යන්නෙන් 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ විධිවිධාන යටතේ ඉදිරිපත් කළ යුතු මූලික පාරිසරික පරීක්ෂණ වාර්තාව අදහස් වේ.

"රජයේ ඉඩමක් නොවන වෙනත් යම් ඉඩමක පදිංචිකරුවෙකු" යන්නෙන් අයිතිකරුගේ ලිඛිත බලපත්‍රයක් ඇතිව වන අලි කළමනාකරණ රක්ෂිතයක් ඇතුළත රජයේ නොවන වෙනත් යම් ඉඩමක පදිංචි තැනැත්තෙකු අදහස් වේ.

"ආඥාපනත" යන්නෙන්, (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත අදහස් වේ.

"රජයේ ඉඩම්" යන්නට අඥාපනතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

EOG 01 - 0290

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.